

# ගෞතම බුදු රජාණන් වහන්සේ

ගෞතම සිද්ධාර්ථ බෝසතාණෝ බුද්ධත්වයට පත්වූයේ වෙසක් පොහෝ දිනකය. බුද්ධ යනු සත්‍යාවබෝධය යි. මෙම වෙසක් පුර පසළොස්වක පොහෝ දිනයත් සමග 2600 වන බුද්ධ ජයන්තිය උදාවෙයි. එම අසිරිමත් අවස්ථාව ලොවපුරා බෞද්ධ ජනතාව සැමරීම ට සූදානම් වෙති. සන්නස සමග එක්ව කෙටි ලිපි පෙළකින් එය මෙසේ සමරමු.

**කිං කුසල ගවේසී**

සත්‍ය ගවේෂණයෙහිලා සිත නැඹුරු විය. බෝසතාණන් වහන්සේ රජසැප හැරදමා එමගට පිළිපන්නේ විසිනව වන වියේදී ය. ආලාර කාලාම,

***<u>ධර්ම මාර්ගයට පිවිසෙන්නා පළමුව බුදුන් වහන්සේ දැකිය යුතුය. දැකීම නම් ශ්‍රද්ධාවයි. ශ්‍රද්ධාව ලැබිය යුත්තේ අවබෝධයෙනි.</u>***

උද්දක රාමපුත්‍ර තාපස වරුන් සමග ධ්‍යාන වැඩූහ. සමාධි සිත කෙලෙසුන් ගේ ක්‍ෂයවීම නොවන බව අවබෝධ විය. තවද දුෂ්කර ව්‍රතවල යෙදීමෙන් ඵලක් නොවන බව වැටහිණි. එබැවින් මධ්‍යම ප්‍රතිපදාවට එළඹ හේතු-ඵල දහම අවබෝධයෙහිලා වීර්ය වැඩූහ. වෙසක් පුන් පොහෝ දින බුද්ධ ගයාවේ බෝධි මූලයේදී සියලු කෙලෙසුන් නසා බුද්ධත්වයට පත්වූහ. එදවස පටන් බෝසතාණන් වහන්සේ ගෞතම බුදුන් වහන්සේ නමින් ප්‍රකට වූහ.

බුදුන් වහන්සේ අපගේ ශාස්තෘ වරයාණෝය. උන් වහන්සේ දැකීම අප අපම කළ යුතුය. දේශිත ශ්‍රී සද්ධර්මය එයට මාර්ගයයි. වරෙක සච්චක නම් නිගණ්ඨ පුත්‍ර ට බුදුන් වහන්සේ මෙසේ වදාළහ.

ඒ භාග්‍යවතුන් වහන්සේ සියුසස් දහම (නිවන) අවබෝධ කළසේක. අන් අයට ද අවබෝධය පිණිස දහම් දෙසන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඉඳුරන් දමනය කළසේක. අන් අයටද ඉඳුරන් දමනය පිණිස දහම් දෙසන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ කෙලෙසුන්ගෙන් සන්සිඳුනාහු ශාන්ත භාවයට පත්වූ සේක. අන් අයටද ශාන්ත භාවයට පත්වීම පිණිස දහම් දෙසන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ සසර සයුරු තරණය කළසේක. අන් අයටද සසර සයුරු තරණය පිණිස දහම් දෙසන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ කෙලෙස් පිරිනිවෙනින් පිරිනිවුන සේක. අන් අයටද පිරිනිවීම පිණිස දහම් දෙසන සේක. විමුක්ති සිත් ඇති භික්ෂුව මෙසේ ගරුකාර මානන පූජන කෙරෙයි.

මෙසේ දේශනා කිරීමෙන් බුදුන් වහන්සේ අද්භූත පුද්ගලයෙකු නොවන බවත් අපගේ සැනසීම සහ නිවීම පිණිස මාර්ගය කියාදෙන්නා බවත් පෙන්නුම් කොට ඇත. (තුම්මෙහි කිච්චං ආතප්පං -- අක්ඛාථාරෝ තථාගතා )
ධර්ම මාර්ගයට පිවිසෙන්නා පළමුව බුදුන් වහන්සේ දැකිය යුතුය. දැකීම නම් ශ්‍රද්ධාවයි. ශ්‍රද්ධාව ලැබිය යුත්තේ අවබෝධයෙනි.

**සද්ධහති තථාගතස්ස බෝධිං.**

එනම් තථාගතයන් වහන්සේගේ අරහං ආදී බුදුගුණ දැකීමයි. බුදු සිරිතෙන් හා දේශිත දහමින් පිවරුපී තථාගතයන් වහන්සේ හදවත නම් වූ පූජාසනය මත බුහුමනට ලක්වීම ශ්‍රද්ධාවෙහි ආරම්භයයි. අවසානය ප්‍රඥාවයි. ශ්‍රද්ධාවෙන් ප්‍රඥාව කරා යාමට සේඛ ධර්මයෝ මහෝපකාරී වෙයි. එනම් ශ්‍රද්ධාව, ශීලය, ධර්ම ශ්‍රවනය, පරිත්‍යාගය, ධර්මාවබෝධය යන සේඛ ධර්ම ප්‍රගුණ කළ යුතුය.

ප්‍රාර්ථනා කිරීමෙන් පමණක් ධර්මාවබෝධය ට තබා බ්‍රහ්ම සහවාසයටවත් පිවිසිය නොහැකි බව බුදුන් වහන්සේ වදාළහ.

මහණෙනි, කිකිළියක බිත්තර රැකීමේදී පැටවුන් මෙසේ ඇතිවිය යුතුයයි අදහසක් නොමැත. නිසිකල්හි පැටව් නිය තුඩින් හෝ හොටින් කටුව බිඳගෙන බිහිවෙති. එනයින්ම ධර්මය ප්‍රගුණ කරන්නා කරා සැනසීම සහ නිවීම ළඟාවේ.

මෙයින් ගම්‍ය වන්නේ ධර්මයෙහි හැසිරීම ධර්මාවබෝධය ට ප්‍රවිශ්ට වන මාර්ගය වන බවයි. එයින් ලබන විඳීම හෙවත් සැනසීම යනු බුදුන් වහන්සේ දැකීමයි.

ශාස්ත්‍රපති
පල්ලෙවෙල දේවරක්ඛිත
ස්වාමීන් වහන්සේ
විහාරාධිපති, පාරමිතා බෞද්ධ විහාරය
රොක්බෑන්ක්

## වෙසක් පෝය නිමිත්තෙන් පවත්වන විශේෂ සීල භාවනා වැඩ සටහන

## මහමෙව්නා භාවනා අසපුව

වෙසක් පොහොය නිමිත්තෙන් මහමෙව්නා භාවනා අසපුව මගින් සදහම් දේශනා ඇතුළත් විශේෂ සීල භාවනා වැඩ සටහනක් මෙල්බර්න් නුවරදී පැවැත්වීමට කටයුතු යොදා ඇත

අති පූජනීය කිරිබත්ගොඩ ඥාණානන්ද ස්වාමීන් වහන්සේගේ ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ නමක් විසින් මෙම සදහම් වැඩ සටහන මෙහෙයවනු ලැබේ

**දිනය: මැයි 23 වන ඉරිදා - 23-5-2010**

වේලාව: උදේ 8:30 සිට සවස 4:30 දක්වා
ස්ථානය:
නේබර්හුඩ් ශාලාවල මල්ග්‍රේව්
Neighbourhood House, Mulgrave
(වෙලින්ටන් රිසර්ව් ප්‍රජා මධ්‍යස්ථානය)
(Wellington Reserve Community Centre)
අංක 36-42 මැකී පාර මල්ග්‍රේව්
36 - 42 Mackie Road, Mulgrave. 3170
(Melway Ref: 80 B2)

මෙම සදහම් වැඩ සටහනට සහභාගී වන මෙන් සැදැහැවත් පින්වතුනට මෙයින් ආරාධනය කරමු

සහභාගී වන සැදැහැවතුන් හට දහවල් දානය සපයනු ලබන අතර දාන කටයුතු වලට සහභාගි වීමට කැමති අය කරුණාකර අප අමතන්න

ඔබගේ ඥාතීන්ට පින් පැමිණවීම සඳහා මෙම පුණ්‍ය කටයුතු වලට සහභාගී වීමට කැමති පින්වතුන් ඒ පිළිබඳව අප වෙත දැනුම් දෙන්න

**විස්තර සඳහා අමතන්න**
සුනන්දා තිලකරත්න 8772 5237
ජංගම දුරකතන: 0412 517 843

7 වන පිටෙන්

පාර්ලිමේන්තුව එය ප්‍රතික්ශේපකරන ලද අතර දෙවැනි වරට සංශෝධන සහිතව නාමලේඛනය ඉදිරිපත් කිරීමෙන් පසුවද අනුමැතිය ලැබී තිබුණේ අමාත්‍යවරුන් 11 කට පමණි. ඔබාමා සමග පැවති සාකච්ඡාවට ඒ එකොළොස්දෙනාද සහභාගීකරවාගන්නා ලද්දේ ඔබාමාගේ ඉල්ලීමකට අනුවය.

කර්සායි එක් අතකින් ඇමරිකාවෙන් යුද ආධාර ලබාගන්නා අතරම අනෙක් පැත්තෙන් ඇමරිකාව අකමැති දේ කරමින් යම් ස්වාධීන බවක් ප්‍රකට කරන්නටද උත්සාහ දරමින් සිටියි. චීනය ඉරානය පාකිස්ථානය යන රටවල නිල සංචාරයන්හි යෙදෙමින් එම රටවල් සමග පවතින සබඳතා ශක්තිමත් කරගනිමින් සිටියි. අනෙක් අතට ඇමරිකාවේ අකමැත්ත නොතකා හරිමින් සටන්කාමී සංවිධාන නායකයන් සමඟ සාකච්ඡා ද පවත්වයි. ඔබාමාගේ හදිසි සංචාරය ඇෆ්ගනිස්ථානය තවදුරටත් ඇමරිකාවේ අවශ්‍යතා අනුව කටයුතු කළ යුතු බවට වන ඉඟියක් වන විට, නව මැතිවරණ කොමසාරිස්වරයෙකු සහ තවත් නිලධාරීන් කිහිප දෙනෙකු මැතිවරණ කොමිසමට පත්කිරීම අකමැත්තෙන් වුවද කර්සායි ඊට දැක්වූ ප්‍රතිචාරයක් ලෙස සැළකිය හැකිය.



## ගෙදරට මරගාතේ

ප්‍රංශයේ රේඩියෝ ප්‍රාන්ස් ගුවන් විදුලිය සහ ප්‍රාන්ස් 24 ආයතනය එක්ව රටවල් හයක සිදුකළ ජනමත විචාරණයකින් ලෝකයේ ජනප්‍රියම පුද්ගලයන් දෙදෙනා ඇමෙරිකා ජනාධිපති බැරැක් ඔබාමා සහ ටිබෙටයේ අධ්‍යාත්මික නායක දලයි ලාමා ලෙසට අනාවරණය කරගෙන තිබේ. ඔබාමාට 77% ක් සහ ලාමාට 75% ක වශයෙන් ජනතා මනාපය හිමිවී ඇතැයි සමීක්ෂකයෝ පවසති.ඒ අප්‍රේල් මාසය අවසානයේ ලෝකයේ තක්සේරුවයි. ඉකුත් මාර්තු මාසයේ ඇමරිකාවේ සිදුකළ සමීක්ෂණයකින් හෙළිවී තිබුණේ ඇමරිකාව තුළ ඔබාමාගේ ජනප්‍රියත්වය සීඝ්‍රයෙන් පහළ බසිම්-න් පවතින බවය. එරට ජනතාවගෙන් 47% ක් ඔබාමාගේ ක්‍රියාකාරීත්වය අනුමත නොකරන බව සමීක්ෂණයෙන් අනාවරණය වී තිබිණි. අනුමත කර තිබූ සංඛ්‍යාව 46% කි. ඔබාමා බලයට පත්වීමෙන් පසු 2009 මුල්කාලයේ ඇමරිකාවේ සිදුකරන ලද සමීක්ෂණයකදී ඔබාමාගේ ක්‍රියාකාරීත්වය අනුමත කරනු ලැබ තිබූ සංඛ්‍යාව 68% ක් ලෙස වාර්තා වී තිබිණ. මේ අනුව පෙනීයන්නේ ඔබාමා ලෝකෙට පරකාසේ ගෙදරට මරගාතේ බවට පත්ව ඇති බවය.

එය එසේ වුවද න්‍යෂ්ඨික අවි අනතුරෙන් ආරක්ෂිත ලොවක් යන අරමුණ ඇතිව ඇමරිකාවේදී පවත්වනු ලැබූ දෙදින ගෝලීය සමුළුවේ මුලසුන හිමිවූයේ ඔබාටය. රටවල් 47 ක නායකයන් සහභාගී වූ මේ සමුළුව වසර 65 කට පසුව ඇමරිකානු ජනාධිපතිවරයෙකුගේ සහභාගීත්වයෙන් පැවති විශාලතම ගෝලීය සමුළුව ලෙස සැළකේ.

අප්‍රේල් 11 දා සමුළුවේ සභාපතිවරයා සමුළුව අමතා ප්‍රකාශයක් කරමින් කියා සිටියේ ඉස්ලාමීය සටන්කාමී-න් අතට න්‍යෂ්ඨික අවි පත්වුවහොත් ඇතිවිය හැකි තත්ත්වය පිළිබඳ ඇමරිකාව දැඩි බියකින් පසුවන බවය. අල් ක්වයිදා වැනි සංවිධානයකට න්‍යෂ්ඨික අවි අත්වුවහොත් ඒවා යොදාගනිමින් ඔවුන් ඇමරිකාවට ප්‍රහාරයක් එල්ල කරනු ඇති බවට කිසිම සැකයක් නැතැයිද ප්‍රකාශ කෙළේය. න්‍යෂ්ඨික අවිහරණ වැඩපිළිවෙළකට ඇප කැප වෙන බව ජනාධිපති ධූරයට පත්වූ අවස්ථාවේදී ඔබාමා ප්‍රකාශ කර තිබුණු අතර අප්‍රේල් මස ආරම්භයේදී ඒ සම්බන්ධයෙන් වන ද්විපාර්ශ්වික ගිවිසුමක් රුසියාව සමග අත්සන් කිරීමටද ඔහු කටයුතු කර තිබුණි.

**ශ්‍රීලාල් සෙනෙවිරත්න**
http://www.Srilalsenavirathna.wordpress.com
Srilal333@yahoo.com